# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1832 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 11/12/2024<br>පැය 2100 |

**මාධ්‍ය නිවේදනය**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**පුවත්පතක සහ සමාජ මාධ්‍ය තුළ පළ වූ පුවතක් සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කිරීම.**

2024.12.11 වන අද දින පුවත්පතක හා සමාජ මාධ්‍ය තුළ පළ කර ඇති පුවතක් කෙරෙහි අවධානය යොමු කරවමි.

එම පුවත අනුව, ගුරු පත්වීම් ඉල්ලා පාසල් සංවර්ධන නිලධාරීන් පිරිසක් පසුගිය 02 වන දින බත්තරමුල්ල, ඉසුරුපාය අධ්‍යාපන අමාත්‍යාංශය ඉදිරිපිට පැවැත්වූ විරෝධතාවයේදී තියුණු ආයුධයකින් කපා පොලිස් නිලධාරීන් තිදෙනෙකුට තුවාල සිදු කළැයි කියන පුද්ගලයා යුධ හමුදා බුද්ධි අංශ නිලධාරියෙකු බවට සිදුකල විමර්ශන වලදී අනාවරණය වී ඇතැයි තලංගම පොලිසිය කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයට දැනුම් දුන් බවට ඇතැම් මුද්‍රිත මාධ්‍ය සඳහන් කර ඇත.

මෙම සිද්ධිය සම්බන්ධයෙන් දැනට තලංගම පොලිසිය මඟින් සිදුකරනු ලබන විමර්ශන අනුව යුධ හමුදා බුද්ධි අංශ නිලධාරියෙකු විසින් මෙම තුවාල කිරීම සිදුකර ඇති බවට කිසිදු තොරතුරක් අනාවරණය වී නොමැත.

එසේ තිබියදී, ගරු අධිකරණයේ එදින පෙනී සිටි නිලධාරියා මෙවැනි කරුණු දැක්වීමක් සිදුකලාද යන්න පිළිබඳව වැඩබලන පොලිස්පතිතුමාගේ නියමයෙන් පොලිස් විශේෂ විමර්ශන ඒකකය මඟින් විමර්ශනයක් ආරම්භ කර ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**